# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 41 දරන ශ්‍රී ලංකාවේ සිල්වෙස්තර-බෙනදික්තානු නිකායේ ප්‍රධාන පූජ්‍යවරයා (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 ජූනි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 ජූනි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 35 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

1981 අංක 41 දරන ශ්‍රී ලංකාවේ සිල්වෙස්තර-බෙනදික්තානු නිකායේ ප්‍රධාන පූජ්‍යවරයා (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1981 ජූනි මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 81/80

**ශ්‍රී ලංකාවේ සිල්වෙස්තර-බෙනදික්තානු නිකායේ ප්‍රධාන පූජ්‍යවරයා සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

මෙහි මින් මතු දක්වා ඇති කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ සිල්වෙස්තර-බෙනදික්තානු නිකායේ ප්‍රධාන පූජ්‍යවරයා සංස්ථාගත කිරීම යෝග්‍ය වන හෙයින් : **පූර්විකාව.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 41 දරන ශ්‍රී ලංකාවේ සිල්වෙස්තර-බෙනදික්තානු නිකායේ ප්‍රධාන පූජ්‍යවරයා (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මේ පනත ආරම්භ වීමේ දින සිට හා ඉන් පසු, ශ්‍රී ලංකාවේ සිල්වෙස්තර-බෙනදික්තානු නිකායේ ප්‍රධාන පූජ්‍යවරයා, එනම් අති පූජ්‍ය තෝමස් ද සිල්වා ඕ. එස්. බී. පියතුමා සහ රෝමානු කතෝලික සභාවේ නීති රීති සහ චාරිත්‍ර අනුව විධිමත් ලෙස පත් කරනු ලබන ඔහුගේ අනුපිළිවෙළින් එන අනුප්‍රාප්තිකයා හෝ අනුප්‍රාප්තිකයන් "ශ්‍රී ලංකාවේ සිල්වෙස්තර-බෙනදික්තානු නිකායේ ප්‍රධාන පූජ්‍යවරයා" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර සෑම ආකාරයක ම චංචල හෝ නිශ්චල දේපළ මිලට ගැනීමෙන්, ත්‍යාග ලැබීමෙන්, අන්තිම කැමැති පත්‍රයක් මගින් ප්‍රදානය කිරීමෙන්, රික්ථවරණය කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් අත් කර ගැනීමට සහ ඒ දේපළ දැරීමට සහ භුක්ති විඳීමට සහ ඒ දේපළ විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සම්පූර්ණ බලය තිබිය යුතු ය. තවද එකී නාමයෙන් ඒ දේපළ සම්බන්ධයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ යුතු හා කළ හැකි වන්නේ ය. **ශ්‍රී ලංකාවේ සිල්වෙස්තර-බෙනදික්තානු නිකායේ ප්‍රධාන පූජ්‍යවරයා සංස්ථාගත කිරීම.**

3. ශ්‍රී ලංකාවේ සිල්වෙස්තර-බෙනදික්තානු නිකාය සඳහා භාරයක් පිට මහනුවර බිෂොප්තුමා විසින් දැනටමත් අත් කරගෙන, දරනු ලබන හෝ භුක්ති විඳිනු ලබන සියලු චංචල සහ නිශ්චල දේපළ සංස්ථාව වෙත මෙයින් පවරනු ලබන අතර මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම ඒ දේපළ සම්බන්ධයෙන් වූ යම් භාරවලට, කොන්දේසිවලට හෝ සීමා කිරීම්වලට යටත්ව සංස්ථාව සතු විය යුතු ය. **නිකාය සඳහා භාරයක් පිට දරන ලද දේපළ.**

2—ඒ 54747—10,725 (81/01)

පුරප්පාඩු පිරවීම.

4. ශ්‍රී ලංකාවේ සිල්වෙස්තර-බෙනදික්තානු නිකායේ ප්‍රධාන පූජ්‍යවරයා මියගිය විටෙක හෝ දුබලතාව නිසා හෝ දිගු කලක් බැහැරව සිටීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ තම කාර්ය ඉටු කිරීමට ඔහුට නොහැකි වන විටෙක, ශ්‍රී ලංකාවේ සිල්වෙස්තර-බෙනදික්තානු නිකායට ඇතුළත් වීමේ අනුපිළිවෙළ අනුව වඩාත්ම ජ්‍යෙෂ්ඨ වූ ඔහුගේ උපදේශකවරයා, අවස්ථාවෝචිත පරිදි, නව ප්‍රධාන පූජ්‍යවරයකු පත් කරනු ලබන තුරු හෝ ප්‍රධාන පූජ්‍යවරයා විසින් තම කාර්ය ඉටු කිරීම නැවත ආරම්භ කරනු ලබන තුරු මේ පනතේ සියළු කාර්ය සඳහා ප්‍රධාන පූජ්‍යවරයා ලෙස සලකනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

5. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ අයිතිවාසිකම් හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.